**වේලනෙයි ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වේලනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ඉදිකරනු ලැබූ සුසාන භූමි 15 ක වටිනාකම් තක්සේරු කර පසුගිය වර්ෂ 1 ක සිට වර්ෂ 6 දක්වා කාලය තුළදී මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | සුසාන භූමි වටිනාකම තක්සේරු කර පොත්වල දැක්විය යුතු වේ. | සභවේ සුසාන භූමි සභාවට අයත් ලෙස සඳහන් කරන නමුත් ඒවා අප සතුව පවතින බවට ලිපි ලේඛන නොමැත. එසේ වුවත්, දේපළ සභාව වෙත පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් කටයුතු කර ඇත. ඉන් පසුව |

වටිනාකම් තක්සේරු කර ඇතුළත් කරනු ලැබේ.

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

රු. 440,478ක් වටිනා ගිණුම් විෂයයක් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීමෙන් විගනනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු (1158053) | රු. 440,478 | ස්ථාවර වත්කම් සහතික | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂ සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉහත තැන්පතු සම්බන්ධයෙන් දිසාපතිවරයාට අප විසින් ලිපි යවා පිළිතුරු ලැබී ඇත. අදාළ ස්ථාවර තැන්පතු තමන්ගේ බවත් ඒ පිළිබඳ සාක්ෂි තමන් සතු නොවන බවත් එම ලිපියෙන් සඳහන් කර තිබුණි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | කාර්යසාධන වාර්තාව සකස් කළ නමුත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට නොහැකි විය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 126(iii)(ඊ) | ආදායම් පරීක්ෂකවරයා විසින් රු.388,000 ක් වටිනා අනවසර ප්‍රචාරණ දැන්වීම් 44 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | අනවසර ප්‍රචාරණ සම්බන්ධයෙන් අදාල අයට ඒ වනවිටත් ලිපි යවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති III පරිච්ඡේදයේ 32 වගන්තිය | දේපළ මත තක්සේරු බදු ලේඛනය සභාව විසින් නඩත්තු කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් හා බදු අයකර නොතිබුණි. | අදාළ රීතින්හි උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු අයකිරීම සඳහා ප්‍රදේශ සලකුණු කිරීමට ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා ලිපි යවා ඇත. |
| (ඇ) රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | | | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 12 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | යාන්ත්‍රික ඉංජිනේරුවරයාට දැනුම් දී ඇත. |

**1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රචාරක ආයතනවලින්, බැංකු සහ කොමිස් ලබාගන්නා ස්ථානවලින් විකුණුම් තොරතුරු ලබාගෙන කොමිස් අයකර ගත යුතු වේ. | නිවැරදි මාර්ගෝපදේශ නොලැබීම හේතුවෙන් අපහට අයකළ නොහැකි විය. එසේ වුවත්, බදු අයකළ හැකි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,294,873 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,196,073 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 446,800 | - | 3,162,733 | - | 663,800 | - | 970,400 | - |
| කුලී | 1,557,000 | - | 1,772,281 | 23,250 | 684,900 | - | 3,150,962 | 115,271 |
| බලපත්‍ර ගාස්තු | 420,300 | - | 726,906 | - | 379,000 | - | 297,480 | - |
| වෙනත් ආදායම් | 50,637,770 | - | 41,449,160 | 8,525,189 | 45,988,590 | - | 35,912,708 | 14,186,143 |
| එකතුව | **53,061,870** | **-** | **47,111,080** | **8,548,439** | **47,716,290** | **-** | **40,331,550** | **14,301,414** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.6,779,530 කින් වැඩි වී තිබුණි. එසේ වුවත් බිල්කළ ආදායම තහවුරු කරගත නොහැකි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | දීර්ඝකාලයක සිට පැවැති හිඟ මුදල් ලැබෙනු ඇතැයි විශ්වාසයක් නොමැති නිසා බිල් කර නොතිබුණි. ප්‍රවර්තන වර්ෂයේ බිල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ අවසානයේ එකතුව රු. 50,000 ක් වටිනා සභා බල ප්‍රදේශයේ පවතින විදුලි සංදේශ කුළුණු සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සහ ඉදිකිරීම් ගාස්තු අයකිරීමට කටයුතු නොකර හිඟ හිටව පැවැතුණි. | හිඟ හිටව පවතින විදුලි සංදේශ කුළුණු සඳහා සහ ඉදිකිරීම් ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | Hutch විදුලි සංදේශ කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු ගෙවන ලෙසට ලිපි ඒ වනවිටත් යවා ඇත. |

### 2.2.4 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් මුද්දර ගාස්තු රු.8,525,189 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ මුදල් ප්‍රවර්තන වර්ෂයේ ලැබීමට නියමිතය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුවවිහරණය, පහසුකම් සහ සුභසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරුණු පහත සඳහන් පරිදි විය.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් සකස් කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2018 වර්ෂයේ සකස් කර නොතිබුණි. 2019 වර්ෂයේ සකස් කර ඇත. |

#### (ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සති පොළ ඉදිකිරීම සඳහා වැයකළ රු.885,000 කින් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කරගෙන තිබුණද, අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වී තිබුණි. | සති පොළ භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | සතිපොළ බදු ගැනීම සඳහා කිසිඳු අයකු ඉදිරිපත් නොවීම හේතුවෙන් සතිපොළ, කඩ කාමර සංකීර්ණයක් බවට පත්කර කුලියට දීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ඇ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භ කළ යුතු දිනයේ ක්‍රියාකාරකම් 09 ක් ආරම්භ කර තිබුණත් මේ දක්වා අදාළ ක්‍රියාකාරකම් අවසන් කර නොතිබුණි. | ක්‍රියාකාරකම් නියමිත කාලයේ අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | මාර්ග සඳහා බොරළු ලබාගැනීම සඳහා වූ අවසරය ලබාගැනීමේදී කාල ප්‍රමාදයන් සිදුවිය. වර්තමානයේ ඛනිජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් අවසරය ලැබී කාර්යයන් ක්‍රියාත්මක වේ. |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කළ දිගුකාලීන හා කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ රු.75,280 ක් වැයකර තිබුණත් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වේලනෙයි ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය පහත මට්ටමක පැවති නිසා ඔවුන්ගෙන් කසළ ඉවත් කිරීම සඳහා ගාස්තු අය නොකෙරේ. |
| (ii) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාවට සෞඛ්‍ය සම්බන්ධ ගැටළු ඇති වී තිබූ අතර ප්‍රමාණයට අධිකව කසළ ප්‍රවාහනය කිරීම නිසා කසළ මාර්ගය පුරා වැටී තිබුණි. | ආවරණය කළ වාහන භාවිතා සෞඛ්‍ය ගැටළු වලක්වාලීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ ට්‍රැක්ටරයට දැල් මිලදී ගැනීම සඳහා ඒ වන විටත් සභාව තීරණය කර තිබුණි. |
| (iii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමට ප්‍රවර්තන වර්ෂයේ කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iv) | වේලනෙයි උප කාර්යාලය සහ අල්ලායිපිටි උප කාර්යාල බල ප්‍රාදේශවල සන අපද්‍රව්‍ය රැස්කර අරාලි සන අපව්‍රව්‍ය රැස්කරන ප්‍රදේශයට මුදා හරිනු ලබන ජාතික ප්‍රතිපත්තියට අනුව වෙන් කිරීම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ජාතික ප්‍රතිපත්තියට අනුව වෙන් කිරීම් සඳහා කටයුතු කළ යුතුවේ. | වෙන්කිරීමට හැකි පරිදි සන අපද්‍රව්‍ය නොලැබේ. එසේම, නොදිරන කසළ අවම ප්‍රමාණයක් ලැබෙන නිසාත් සන අපද්‍රව්‍ය වෙන්කිරීම සඳහාත් ප්‍රමාණවත් සේවකයන් නොමැති නිසාත් වෙන්කරනු නොලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | ජනතාවට නියමිත කාලයේදී සේවාවන් සැලසිය යුතු වේ. | වෙනත් ආයතනවලින් ලිපි ආපසු ලැබීමේදී සිදුවන කාල ප්‍රමාදයන් මේ සඳහා හේතු වී තිබුණි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 20 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |
| (ආ) | තනතුර හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.35,295 ක්වූ හිඟ ආපදා ණය අයකර ගැනීම සඳහා පසුගිය වසර දහයකට අධික කාලයක් පුරාම අයකර ගෙන නොතිබුණි. | ආපදා ණය හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉහත සේවකයාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් ඉහත වටිනාකම අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වේලනෙයි, පුංගුඩිතීවු, නයිනා තීවු, අල්ලෙයිප්පිට්ටි, මන්ඩෙයිතීවු ආදී උප කාර්යාල | වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු අයකිරීමට ප්‍රදේශ සලකුණු කිරීමට ගැසට් පත්‍රයේ පළකිරීමට ලිපි යවා ඇත. |

| | | | |
|---|---|---|---|
| | 05 ක් මගින් මෙම උප කාර්යාලවල දේපල 6,183 ක් වරිපනම් බදු අයකිරීම සඳහා දත්ත රැස්කිරීම හැර අයකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විවිධ සංවර්ධන කාර්යයන් ඉටු නොකර රු.29,630,320 ක් වටිනා අරමුදල් බැංකුවේ පොලී ඉපැයීමේ අරමුණෙන් තැන්පත් කර තිබුණි. | ස්ථාවර වත්කම් අදාළ අවශ්‍යතා සඳහා උපයෝජනය කළ යුතු වේ. | වර්ෂ කිහිපයකට පෙර තැන්පත් කළ ස්ථාවර තැන්පතුවල අරමුණ සඳහන් වී නොතිබුණි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුළු ණයහිමි ගිණුමේ අංක NPLG-8951 දරන පිකප් වාහනය අලුත්වැඩියාව සඳහා රු.665,000 ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් මේ දක්වා අලුත්වැඩියාවන් කිසිවක් සිදුකර නොතිබුණි. | අදාළ වාහනය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | වාහනය අලුත්වැඩියා කර ඇත. අදාළ වියදම් සුළු ණයහිමියන් ගිණුමෙන් ගැලපීමට කටයුතු කරනු ලැබේ. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.15,411,000 ක් වටිනා වාහන 19 ක අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | දිගු කාලයක සිට ලියාපදිංචි කිරීමේ පොත නොමැති වීම නිසා දැන් පොලිස් වාර්තා ලබාගැනීමේ ගැටළු පවතී. |

**3.5.3 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නයිනාතිවු උප කාර්යාල ප්‍රදේශයේ ශාරීරික සුවතා මධ්‍යස්ථානය නඩත්තු කිරීම | ශාරීරික සුවතා මධ්‍යස්ථානය නඩත්තු කිරීමට කටයුතු කළ යුතු | සුදුසු පුහුණුකරුවකු නොමැති වීමෙන් ක්‍රියාත්මක නොවුණි. පුහුණුකරුවකු ලබාගත් පසුව |

| | | |
|---|---|---|
| සඳහා විවිධ උපකරණ මිලදී ගෙන තිබුණත්, එය වර්ෂයකට අධික කාලයක සිට භාවිතා කර නොතිබුණි. | වේ. | ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

**3.5.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුංගුඩිතීවු උප කාර්යාලයේ පොත් 03 ක් සහ නයිනාතීවු උප කාර්යාලයේ පොත් 111 ක් ද අල්ලෙයිප්පිට්ටි උප කාර්යාලයේ පොත් 26 ක් ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අයකළ සියළුම රිසිට්පත් ඉදිරිපත් කළ යුතු වේ. | උප කාර්යාලවල භෞතික පරීක්ෂාවට ඉදිරිපත් නොකළ පොත්වල වටිනාකම, වගකිව යුතු සේවකයින්ගෙන් අයකරගෙන ඇත. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාව විසින් භාණ්ඩ හා සේවා ක්‍රියාකාරකම් සඳහා සකස් කළ යුතු වේ. එසේ වුවත්, සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. දෝෂයකින් ඉදිරිපත් කර නොතිබුණි. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක වැටුප්, භාණ්ඩ අවශ්‍යතා සහ මූලධන වත්කම් අලුත්වැඩියා වියදම්වල ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර අධික වශයෙන් විචලනයක් පැවති අතර මෙය වියදම් ඇස්තමේන්තුවේ අඩුපාඩුවක් ලෙස සැලකුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන කළ වියදමට වඩා අමතරව වියදම් ඇතිවීමෙන් පරිපූරක අයවැය සකස් කර වියදම් සිදු කර තිබුණි. |